# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.06 පැය 1045 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/22/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොලිස් විශේෂ කායර් බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කායර් බලකා බුද්ධි කොට්ඨාසය.**

2025.01.05 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කායර් බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ජාඇල පොලිස් වසමේ ඒකල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 08 මිලි ග්‍රෑම් 260 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ජාඇල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන ඒකල, ජාඇල ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

ජාඇල පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**02. කසල තේ සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කායර් බලකා ගම්පොල කඳවුර.**

2025.01.05 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කායර් බලකා ගම්පොල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් දවුලගල පොලිස් වසමේ හංදෙස්ස ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව පරිබෝජනයට නුසුදුසු කසල තේ කිලෝ 11 ග්‍රෑම් 978 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන දවුලගල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 53 ක් වන ඇඹැක්ක, හංදෙස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

දවුලගල පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවි 03 ක් සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කායර් බලකා බුත්තල කඳවුර.**

2025.01.05 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කායර් බලකා බුත්තල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කොස්ලන්ද පොලිස් වසමේ ගොමදියවෙල ප්‍රදේශයේදී වැටලීම් තුනක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවි 03 ක් සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන කොස්ලන්ද පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 35ත් 47 ත් අතර වයස් වල පසුවන ඇතිලිවැව හා ඌවමාවෙලගම ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

කොස්ලන්ද පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**04. මෙරට නිෂ්පාදිත ගිනි අවිවක් සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අම්පාර කඳවුර.**

2025.01.05 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අම්පාර කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් එරගම පොලිස් වසමේ වනාගමුව හන්දිය ආසන්න ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවකු අත්අඩංගුවට ගෙන එරගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 50 ක් වන ඉරක්කාමම් 03 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

එරගම පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**05. හෙරොයින් සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාලච්චේන කඳවුර.**

2025.01.05 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා වාලච්චේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වාලච්චේන පොලිස් වසමේ මීරාවුඩේ ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර හෙරොයින් ග්‍රෑම් 12 මිලි ග්‍රෑම් 560 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වාලච්චේන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන මීරාවුඩේ 04 ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

වාලච්චේන පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**